**තාක්ෂණික ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය - 2016**

**-----------------------------------------------------------**

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 2000 අංක 03 දරන මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතන නියමාවලියේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.41,497,929 ක් වූ දේපළ පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ක්ෂය අනුපාත ඇස්තමේන්තු කිරීමේදී වූ දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 පැහැදිලි නොකල වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව දිගුකාලීන ආයෝජන වටිනාකම රු.14,433,695 ක් වුවද, විගණනය සඳහා ඉදිරිපත් කළ උපලේඛනය අනුව එම වටිනාකම රු.14,628,056 ක් වුයෙන් රු.194,361 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලා (NDT) සඳහා වූ අයදුම්පත් ගාස්තු ආදායම රු.884,456 ක් වුවද උපලේඛනයට අනුව එය රු.907,050 ක් වූයෙන් රු.22,594 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

විදේශ අධ්‍යයන නිවාඩු ලබා සිටි ආචාර්යවරියකගෙන් හා බැඳුම්කරය කඩකිරීම හේතුවෙන් අය විය යුතු රු. 1,572,914 ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අය කර ගැනීම සඳහා ආචාර්යවරිය විසින් 2016 ජනවාරි 26 දින එකඟතාවය පලකර තිබුණි. ඒ අනුව ආයතනය විසින් මෙම මුදල විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කරන ලෙසට 2016 අගෝස්තු 26 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දන්වා යවා තිබුණද 2016 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල් අය කර ගෙන නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ අංක 45 (2) (1) (xv) වගන්තිය | විශ්වවිද්‍යාලයට අයත් කවර මුදලක් වුවද නීත්‍යානුකූලව ආයෝජනය කළ හැකි යම් සුරැකුම්පතක ආයෝජනය කිරීම හෝ කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක ස්ථිර තැන්පත් මුදලක් ලෙස තැන්පත් කිරීම පාලක සභාවේ කාර්යයක් බව සඳහන් වුවද, 2017 මාර්තු 20 දින වනවිටත් එකතුව රු.1,494,483 ක් වූ අරමුදල් 04 ක් , ස්ථාපිත කර වසර 10 කට වැඩි කාලයක් ගතවී ඇතත් කිසිදු ආයෝජන කටයුත්තකට නොයොදා තාක්ෂණික ආයතනයේ ජංගම ගිණුමෙහි රඳවාගෙන තිබුණි. |
| (ආ) | දේශීය ආදායම් බදු චක්‍ර 07 උපයන විට ගෙවීමේ බදු | මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී ලෙස සේවය කර සප්තවාර්ෂික නිවාඩු ලබාගෙන තාක්ෂණික ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී ලෙස සේවය කර තිබුණු නිලධාරියාට 2015 දෙසැම්බර් 31 සිට 2016 ජූලි 31 දක්වා කාලය සඳහා මාසිකව රු.69,152 බැගින් මාස 08 ක් සඳහා ගෙවා තිබූ එකතුව රු.553,216 ක් වූ වැටුප් මත සියයට 16 ක උපයන විට ගෙවීමේ බදු අයකරගෙන නොතිබුණි. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ මූල්‍ය චක්‍රලේඛ ලිපි අංක 2/2015 හි කරුණු අංක II | යම් කිසි මාසයක නොගෙවූ මහපොළ ශිෂ්‍යත්ව මුදල් ඊළඟ මාසයේ 20 දින හෝ ඊට ප්‍රථම මහපොළ භාරකාර අරමුදල වෙත ආපසු යැවිය යුතු වුවත්, 2015 වසරේ සිට පැවත එන රු.384,600 ක ශේෂයක් 2016 දෙසැම්බර් 31 දක්වාම නිරවුල් කර නොතිබුණි. |

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,698,268 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,754,212 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,452,480 ක වර්ධනයක් සිදුවී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රජයේ ප්‍රදාන රු.28,900,000 කින් එනම් සියයට 23 කින් වැඩි වී තිබීම ඉහත වර්ධනයට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ පැවති රු.3,510,686 ක ඌනතාවය 2016 වර්ෂය වන විට රු.2,698,268 ක අතිරික්තයක් බවට පත්වී තිබූ අතර මෙම කාල සීමාව තුල මූල්‍යා ප්‍රතිඵලයෙහි සැලකියයුතු විචලනයක් නිරීක්ෂණය විය. කෙසේ වුවද මූල්‍යා ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී රු.59,256,335 ක්වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.129,448,778 ක්වී තිබුණි.

## 3.2 ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

-------------------------------------------

ආයතනය විසින් බාහිර ආයතනයකට විරුද්ධව රු.මිලියන 05 ක වන්දි ඉල්ලා මොරටුව දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් පවරා ඇති අතර එම නඩුවේ විත්ති පාර්ශවය විසින් එම නඩුව සම්බන්ධව මහාධිකරණයට ඇපැලක් ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් ගිණුම්වල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

## 4.1 කාර්යසාධනය

-----------------

පශ්චාත් - ද්විතීයික තාක්ෂණික ආයතනයක් සමඟ අනුකූල වන භෞතික පරිසරයක් ස්ථාපිත කිරීමත් , සිසුන්ට සමාජයේ හා කර්මාන්තකරණයේ අවශ්‍යතාවයන් සපුරාලියහැකි හා නම්‍යතාවයෙන් ළඟාවිය හැකි ඉගැන්වීමේ සහ කුසලතා පුහුණු කිරීමේ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමත්, ප්‍රායෝගිකව උචිත වන පර්යේෂණ දිරිගැන්වෙන පරිසරයක් ස්ථාපිත කිරීමත්, සුදුසුකම්ලත් ක්‍රියාශීලී කණ්ඩායමක් බිහිකිරීම සහ ශිෂ්‍යයින්ගේ පූර්ණ සංවර්ධනය ප්‍රවර්ධනය කෙරෙන පරිසරයක් නිර්මාණය කිරීම සහ ආයතනයේ සියළුම ක්ෂේත්‍රයන්හි තත්ත්ව සහ කාර්යක්ෂමතාවය සහතික කෙරෙන කළමනාකරණ පද්ධතියක් ප්‍රවර්ධනය කිරීමත් අරමුණු කරගනිමින් මොරටුව විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතනයක් ලෙස මෙම ආයතනය පිහිටුවා ඇත.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මට අනුව 2015 සහ 2016 යන වර්ෂවලදී ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු.100,000 ක් බැගින් වැය කිරීමට සැලසුම් කර තිබුණද එම වර්ෂයන් වලදී ඒ වෙනුවෙන් කිසිදු මුදලක් වැයකර නොතිබුණි.

(ආ) ආයතනයේ අධ්‍යයන අංශ 09 ක් ක්‍රියාත්මක වී තිබුණු අතර 2013/2014, 2014/2015 අධ්‍යයන වර්ෂවල අධ්‍යයන අංශ 03 ක බඳවා ගත යුතු ශිෂ්‍ය සංඛ්‍යාව හා බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව සැසඳීමේදී පිළිවෙලින් සියයට 6 සිට 47 දක්වා පරාසයක් තුල ශිෂ්‍ය පුරප්පාඩු 11 ක් හා සියයට 5 සිට සියයට 40 දක්වා පරාසය තුල පුරප්පාඩු 09 ක් ද 2015/2016 අධ්‍යයන වර්ෂයේ අධ්‍යයන අංශ 02 ක සියයට 33 සිට සියයට 40 දක්වා ශිෂ්‍ය පුරප්පාඩු 06 ක් ද විය.

(ඇ) (i) 2016 වර්ෂයේදී පළමු වසර විභාගයට පෙනී සිටි සිසුන් 504 දෙනෙකුගෙන් සිසුන් 334 ක් පමණක් විභාගය සමත් වී තිබූ අතර සිසුන්ගෙන් සියයට 34 ක් විභාගයෙන් අසමත් වී තිබුණි. එම අසමත් වූ සිසුන් සම්බන්ධ පරීක්ෂාවේදී යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් සියයට 36 ක් ද පේෂකර්ම හා ඇඟළුම් තාක්ෂණ අංශයෙන් පෙනී සිටි සිසුන්ගෙන් සියයට 39 ක් ද අසමත් වී තිබුණි.

(ii) 2016 වර්ෂයේදී දෙවන වසර විභාගයට පෙනී සිටි සිසුන් 484 ක ගෙන් සිසුන් 357 ක් පමණක් විභාගය සමත් වී තිබූ අතර සිසුන්ගෙන් සියයට 27 ක් විභාගයෙන් අසමත් වී තිබුණි. එම දෙවන වසර අසමත් වූ සිසුන් සම්බන්ධ පරික්ෂාවේදී යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් සියයට 41 ක් ද පේෂකර්ම හා ඇඟළුම් තාක්ෂණ අංශයෙන් පෙනී සිටි සිසුන්ගෙන් සියයට 35 ක් ද ලෙස අසමත් වී තිබුණි.

(ඇ) සිසුන්ගේ තරඟකාරීත්වය වර්ධනය සඳහා අධ්‍යයන අංශ 09 මගින් විෂයානුබද්ධ වැඩසටහන් 03 බැගින් හා විෂය බාහිර වැඩසටහන් 03 බැගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද අධ්‍යයන අංශ ඒකාබද්ධව එක් ප්‍රදර්ශනයක් හා එක් ක්‍රීඩා වැඩසටහනක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ඉ) 2016 වර්ෂය තුළ සිසුන් වෙනුවෙන් අළුතින් තොරතුරු තාක්ෂණය (IT) සහ ප්‍රමාණ සමීක්ෂණ (QS) යන පාඨමාලා 02 ක් හඳුන්වා දීමට යෝජනා කර තිබුණද එම පාඨමාලා 2016 වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි.

(ඊ) නවෝත්පාදක හා නිර්මාණශීලීත්වය ඉහළ නැංවීම සඳහා 2016 වර්ෂයේදී රු.1,000,000 ක ප්‍රතිපාදන පර්යේෂණ සඳහා වෙන් කර තිබුණද ප්‍රතිපාදිත මුදලින් සියයට 48 ක් හෙවත් රු.478,215 ක් පමණක් වැයකර පර්යේෂණ 39 ක් සිදුකර තිබුණි.

## 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිළිවෙලින් 28 දෙනෙකුගෙන් හා 11 දෙනෙකුගෙන් සමන්විත වී තිබූ අතර එය පිළිවෙලින් සියයට 48 ක් හා සියයට 20 ක් විය.

(ආ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ 18.1 (1) ප්‍රකාරව උසස් අධ්‍යාපන ආයතනයක සේවක සංඛ්‍යාවෙහි පුරප්පාඩුවක් ඇති බව දැනගත් වහාම, අදාල පත්කිරීමේ බලධරයා ඒ පුරප්පාඩුව පිරවීමට පියවර ගනු ලැබිය යුතු වුවත්, 2015 ජනවාරි 15 සිට පැවති ආයතනයේ නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුර 2016 දෙසැම්බර් 31 දින වනවිටත් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලයක් ඇති කිරීමේ අරමුණින් සමාලෝචිත වර්ෂය තුළ බාහිර කථිකාචාර්යවරුන් 50 දෙනෙක් බඳවා ගැනීම සඳහා රු.15,000,000 ක් වෙන්කර තිබුණද, රු.14,957,457 ක් වැය කර බාහිර කථිකාචාර්යවරුන් 21 දෙනෙකු සහ ඊට අමතරව උපදේශකවරුන් 35 දෙනෙකු බඳවාගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත අදාල වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ 2017 අප්‍රේල් 28 දිනදීය.

## 5.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන සම්බන්ධයෙන් ඩී.එම්.ඒ/2009(1) මාර්ගෝපදේශයේ 3 ඡේදය ප්‍රකාරව වෙනමම අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂකවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු කර නොතිබීම. |
| (ආ) | අයවැය ලේඛනමය පාලනය | අයවැය නිශ්චිත පුරෝකථනයකින් තොරව පිළියෙල කර තිබීම. |
| (ඇ) | අරමුදල් කළමනාකරණය | ආරම්භ කර තිබූ අරමුදල්වල පරමාර්ථ ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඈ) | මෙහෙයුම් පාලනය | ශිෂ්‍යත්ව හා බැඳුම්කර කඩකිරීම් පිළිබඳ විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබීම. |